**සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යකරණය - 2023**

-----------------------------------------------------------------------------------------

සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යකරණය 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2021 ඔක්තෝබර් 07 දින එළඹි අංක L 4121-SRI සහ අංක G9222-SRI දරන ණය සහ ප්‍රදාන ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය සහ ප්‍රදාන ගිවිසුම් ප්‍රකාරව, සෞඛ්‍ය අමාත්‍යාංශය මෙම ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කරව නියෝජිතායතනය වන අතර මධ්‍යම, උතුරු මැද, සබරගමුව සහ ඌව පළාත් සභා හතර ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ මුල් ව්‍යාපෘතියේ මුල් විෂය පථය ක්‍රියාවට නැංවීම සඳහා ඉහත සඳහන් කර ඇති නැවත වෙන්කිරීම් හේතුවෙන් ඇති වන අරමුදල් හිඟය පියවීම, COVID-19 වසංගතයේ මේ වන විට පවතින තුන්වන රැල්ල කළමනාකරණය කිරීම හේතුවෙන් තවදුරටත් වැඩි වෙමින් පවතින ඉල්ලුම සපුරාලීම, ඉහළ ගුණාත්මකභාවයෙන් යුත් පොකුරු රෝහල් වශයෙන් සංවර්ධනය කෙරෙන මුල් ව්‍යාපෘතියේ දිස්ත්‍රික්ක නවයට අයත් එක් එක් දිස්ත්‍රික්කය තුළ අවම වශයෙන් එක් ද්විතීයික සත්කාරක පහසුකමක් (COVID-19 සිද්ධි කළමකාකරණය ඇතුළුව) සංවර්ධනය කිරීම සඳහා සහාය ලබා දීම, දිවයිනේ ඉහළ යන COVID-19 තත්ත්වය සැලකිල්ලට ගෙන දුරස්ථ සහ විද්‍යුත් ඉගෙනුම් සඳහා ලබා ගත හැකි පහසුකම් පුළුල් කිරීම, ව්‍යාපෘතියේ අවසන් දිනය මාස 24 කින් හෝ 2025 නොවැම්බර් දක්වා දීර්ඝ කර, පුළුල් කරන ලද ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කර, ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සහ COVID-19 ආශ්‍රිත මූල්‍යකරණ පරතර සපුරාලීම සඳහා දරිද්‍රතාව අවම කිරීම සඳහා වන ජපාන අරමුදලින් එ.ජ.ඩො. මිලියන 3 ක ප්‍රදානයක් ලබා ගැනීම සඳහා ප්‍රවේශ වීමයි. මෙම ණය සහ ප්‍රදාන ගිවිසුම් ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 24,538.5 කට සමාන එ.ජ.ඩො. මිලියන 123 කි. එයින් රුපියල් මිලියන 22,543.5 කට සමාන එ.ජ.ඩො. මිලියන 113 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යකරණය කිරීමට එකඟ විය. ඉතිරි මුදල වන රුපියල් මිලියන 1,995.0 ක් මූල්‍යකරණය කිරීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරයි. මෙම ව්‍යාපෘතියේ කටයුතු 2021 නොවැම්බර් 17 වන දින ආරම්භ කර ලද අතර 2025 නොවැම්බර් 30 දින වන විට එම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට නියමිතව තිබේ.

## 1.3 තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර**,** 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය, වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහයන් පිළිබඳ සත්‍ය සහ සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සත්‍ය සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සකස් කරන ලද කාර්ය සාධන වාර්තාවට අනුව ක්‍රියාකාරකම් 07ක් සඳහා රුපියල් මිලියන 1324.23ක් වෙන් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ එකී කටයුතු සිදු කිරීමට නොහැකි වී තිබුණි. | සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යකරණය) යටතේ, සමෘද්ධිමත් සහ ඔරොත්තු දෙන ආසියා සහ පැසිෆික් (JFPR) සඳහා වන ජපන් අරමුදල (JFPR) ඇමරිකානු ඩොලර් මිලියන තුනක ප්‍රදානයක් ලබා දී ඇත. 2023 වර්ෂය සඳහා කටයුතු සැලසුම් කර තිබූ අතර මෙම කටයුතු සඳහා 2023 දී ප්‍රතිපාදන ඉල්ලා ඇත. කෙසේ වෙතත් විවිධ හේතූන් මත සැලසුම් කළ කටයුතු ප්‍රමාද විය. | නියමිත කාල සීමාව තුළ කාර්යයන් සම්පූර්ණ කළ යුතුය. |

### 2.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ඌව පළාතේ ව්‍යාපෘති 05 ක ඇස්තමේන්තු වටිනාකම රු. මිලියන 243.5 කි. කෙසේ වෙතත් කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 378 ක් වූයෙන් මුළු ඇස්තමේන්තු වටිනාකමට වඩා සියයට 55 කින් වැඩි වන අතර සබරගමුව පළාතේ ව්‍යාපෘති 03 ක ඇස්තමේන්තු වටිනාකම රු. මිලියන 21ක් වුවත් කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 25.6ක් වූයෙන් එය මුළු ඇස්තමේන්තු වටිනාකමට වඩා සියයට 22කින් වැඩිය.** | **මෙම සියලු ඇස්තමේන්තු 2022 වසරේ ආර්ථික අර්බුදයට පෙර සැලසුම් සහ අධීක්ෂණ උපදේශකවරුන් (RDC) විසින් සකස් කරන ලදී. ආර්ථික අර්බුදයේ උච්චතම අවස්ථාවේ දී ලංසු කැඳවන ලද අතර පෙර නොවූ විරූ ලෙස ද්‍රව්‍ය මිල ඉහළ යාම සලකා බලා ලංසුකරුවන් විසින් සියලුම ලංසු ඉදිරිපත් කරන ලදී. එකී ලංසු ඉංජිනේරු ඇස්තමේන්තුව වඩා බෙහෙවින් වැඩි විය. කෙසේ වෙතත්, එම කාලය තුළ ද්‍රව්‍යමය මිල උච්චාවචනයන් සැලකිල්ලට ගනිමින් ඉංජිනේරු ඇස්තමේන්තු සංශෝධනය කර ඇති අතර අඩුම ප්‍රතිචාර දක්වන ලංසුකරුවන්ට කොන්ත්‍රාත් ලබා දීමට පෙර ලංසු මිල සමඟ සංසන්දනය කර ඇත. මෙම කොන්ත්‍රාත්තු සඳහා ඉදිරිපත් කරන ලද තාක්ෂණික ඇගයීම් වාර්තාවේ මිල වෙනස්වීම් සාධාරණීකරණය කර ඇති අතර ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් වටිනාකම් සංශෝධිත ඉංජිනේරු ඇස්තමේන්තුවලට සමාන විය.** | **ඇස්තමේන්තු සංශෝධනයකදී, නැවත ලංසු කැඳවිය යුතුය.** |
| (ආ) | **සමාලෝචිත වර්ෂයේ කාර්ය සාධන වාර්තාවට අනුව, පළාත් හතරට අදාළව ප්‍රාථමික සෞඛ්‍ය සේවා සංවර්ධනය යටතේ රෝහල් 42ක සිවිල් කටයුතු සඳහා රුපියල් මිලියන 837.68ක් වෙන් කර තිබුණි.** | **සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (අතිරේක මූල්‍යකරණය) යටතේ පළාත් හතරට ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකක (PMCU) සහ මූලික රෝහල් (BH) හතළිස් දෙකක යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට ව්‍යාපෘතිය සැලසුම් කර තිබූ අතර මෙම සිවිල් වැඩ කොන්ත්‍රාත්තු සඳහා මුදල් වෙන් කරන ලදී. කෙසේ වෙතත්, සිවිල් වැඩ කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම ප්‍රමාද වීම** | **ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුය** |

| | | | |
|---|---|---|---|
| | කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිපාදනවලින් උපයෝජනය සියයට **11**කි. | සහ කොන්ත්‍රාත්කරුවන් මුහුණ දෙන විවිධ ගැටලු හේතුවෙන් ඉදිකිරීම් කටයුතුවල මන්දගාමී ප්‍රගතිය වසර සඳහා ප්‍රතිපාදන අඩුවෙන් උපයෝජනයට හේතු වී ඇත. නමුත් අපි රෝහල් නවයක වැඩ අවසන් කර රෝහල් දාහතරක වැඩ කරමින් පවතී. ආයතන දොළහක ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකරමින් පවතින අතර අරමුදල් නොමැතිකම හේතුවෙන් ආයතන හතක් සැලැස්මෙන් ඉවත් කිරීමට තීරණය කරන ලදි. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ ක්ෂේත්‍ර සෞඛ්‍ය මධ්‍යස්ථාන **(FHC) 127**ක් සඳහා රුපියල් මිලියන **1010.14**ක් වෙන් කර තිබූ නමුත් රු. මිලියන **56.01**ක් පමණක් උපයෝජනය කර තිබුණි. | මෙම ව්‍යාපෘතිය මඟින් පළාත් හතරේ ක්ෂේත්‍ර සෞඛ්‍ය මධ්‍යස්ථාන එකසිය විසි හතක් සංවර්ධනය කිරීමට සැලසුම් කර තිබුණි.මේවා බොහෝ දුරට අලුත්වැඩියා කිරීම් සහ වැඩිදියුණු කිරීම් වන අතර, ප්‍රදානය කිරීමේ ප්‍රමාදයන් සහ මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් **2023** වර්ෂයේදී අරමුදල් ඌන උපයෝජනයට ලක්ව ඇත. කෙසේ වෙතත්, අපි ක්ෂේත්‍ර සෞඛ්‍ය මධ්‍යස්ථාන විසිනවයක් සම්පූර්ණ කර ඇති අතර මධ්‍යස්ථාන නවයක වැඩ කරමින් පවතී. තෝරාගත් ක්ෂේත්‍ර සෞඛ්‍ය මධ්‍යස්ථාන හයක් දැනටමත් වෙනත් අරමුදල් ප්‍රභවයන් යොදා ගනිමින් සංවර්ධනය කර ඇත. ක්ෂේත්‍ර සෞඛ්‍ය මධ්‍යස්ථාන හැට තුනක ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකරමින් පවතින අතර මුදල් නොමැතිකම හේතුවෙන් මධ්‍යස්ථාන විසි එකක් සැලැස්මෙන් ඉවත් කර ඇත. | ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුය |

**2.3** මතභේදයට තුඩුදෙන ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| **2012** දෙසැම්බර් **05** දිනැති අංක **AMP/12/1602/509/005-11** දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රජයේ රෝහල් සඳහා වාර්ෂිකව අවශ්‍ය වන ශල්‍ය ගෝස් දේශීය නිෂ්පාදකයින්ගෙන් මිලදී ගැනීමට තීරණය කර තිබුණි. **2022** වසරේදී වෛද්‍ය සැපයුම් අංශය රුපියල් මිලියන **268** ක් වටිනා ශල්‍ය ගෝස් මීටර් මිලියන **03** ක් සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය හරහා ආනයනය කිරීමට කටයුතු කර තිබුණි. | සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය හරහා ගෝස් මීටර් මිලියන දොළහක් මිලදී ගැනීමට වෛද්‍ය සැපයුම් අංශය තීරණය කර තිබූ අතර අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) විසින් **2022** අගෝස්තු **05** වැනි දින අනුමැතිය ලබා දෙන ලදී. කෙසේ වෙතත්, දේශීය සැපයුම්කරුවන්ගේ ඉල්ලීම ගරු අමාත්‍යවරයා විසින් තාවකාලිකව අත්හිටුවන ලදී. **2022** අගෝස්තු **19** වන දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ පැවති රැස්වීමේදී අනාගත අභියෝගවලට මුහුණ දීමට සූදානම් වීම සඳහා ගෝස් මීටර් මිලියන තුනක් මාස තුනක ආරක්ෂිත තොගයක් ලෙස ලබා ගැනීමට තීරණය කරන ලදී. | නීති රීති වලට අනුකූල විය යුතුය. |